# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2011 අංක 12 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 අප්‍රේල් මස 01 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 2.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2011 අංක 12 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2011 මාර්තු 31 වන දින]

එල්.ඩී.—ඕ. 21/2011.

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2011 අංක 12 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2011 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. ලුහුඬු නාමය.

2. 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 2 වන වගන්තිය එහි "මේ පනතේ උපලේඛනයේ" යන වචනවල සිට "ව්‍යාපෘති තිබිය යුතු ය." යන වචන දක්වා වූ වචන ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "මේ පනතේ උපලේඛනයේ සඳහන් ප්‍රඥප්ති එකක් හෝ ඊට වැඩි ගණනක ඇති විධිවිධාන අදාළ කර ගැනීමෙන් හෝ, ජාතික යහපත උදෙසා ක්‍රමෝපාය ආයෝජනය ආකර්ෂණය කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් සහාය හෝ පහසුකම් සම්බන්ධයෙන්, සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන්, කලින් කල, ප්‍රදානය කරනු ලැබිය හැකි නිදහස් කිරීම් කරනු ලැබිය යුතු වූ ද, ඇතැම් ව්‍යාපෘති තිබිය යුතු ය.".

3. 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත, එහි උපලේඛනයේ 8 වන අයිතමයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අයිතම එකතු කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— පනතේ උපලේඛන සංශෝධනය කිරීම.

> "9. 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත.
>
> 10. 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත.".

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2—PL 005582—3,350 (2011/03)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.